රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone | ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax | ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail | වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/03/04
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.01.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී තනතුරක සේවය කරන ලදුව වෙනත් තනතුරක් සඳහා මුදාහැරීමත් පෙරළා නැවත ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී තනතුරකට පැමිණීමත් මත පෙර සේවා කාලය වර්තමාන සේවා කාලයට ඒකාබද්ධ කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම්**

ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන් රජයේ සේවයේ වෙනත් තනතුරකට පත්වීම් ලැබ නව තනතුරෙහි වැඩ භාර ගැනීමෙන් පසුව නැවත ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයට පෙරළා පැමිණීම මත සංවර්ධන නිලධාරී සේවයේ පූර්ව සේවා කාලය නැවත සංවර්ධන නිලධාරී තනතුරට පැමිණීමේ දී සේවා කාලයට ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් නිරන්තර අභියාචනා ඉදිරිපත් වන බව නිරීක්ෂණය වී ඇත. එවැනි අවස්ථාවන්හි දී නිලධාරියා විධිමත්ව සංවර්ධන නිලධාරී සේවයෙන් මුදාහැර ඇති අවස්ථා මෙන්ම මුදාහැරීමේ කටයුතු විධිමත්ව සිදු වී නොමැති අවස්ථාද ඇති බව වාර්තා වේ. මෙවැනි නිලධාරීන් නැවත ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා පෙරළා පැමිණීමට කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වන්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/08-05/02/2014 හා 2017.09.29 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2017 අනුවය. ඒ අනුව නැවත ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට පැමිණීමට කරනු ලබන ඉල්ලීම් මාගේ නිර්දේශ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුවේ.

02. එමනිසා රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සේවයෙන් පරිබාහිර වෙනත් තනතුරක පත්වීම් ලැබ වැඩභාර ගැනීමට අපේක්ෂා කරනු ලබන නිලධාරීන් වෙතොත් අදාළ පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XII පරිච්ඡේදයේ විධිවිධාන අනුව සංවර්ධන නිලධාරී සේවයෙන් විධිමත්ව මුදාහැරීමට නොපමාව ක්‍රියා කළ යුතු බැවින් නිලධාරියාගේ ඉල්ලීම සහ අදාළ ලිපි ලේඛන කඩිනමින් මා වෙත යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි.

03. එසේ මුදාහරිනු ලබන නිලධාරීන් නැවත ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී තනතුරට පැමිණීමට කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ අතර, එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/08-05/01/2022 හා 2022.03.18 දිනැති ලිපියෙන් ලද තීරණ සහ එවැනි නිලධාරීන්ට පෙර

සේවා කාලය සඳහා වැටුප් වර්ධක ලබාදීමේ හැකියාව පිළිබඳ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST 5/5/15-Vol I හා 2022.07.27 දිනැති ලිපිය මඟින් දන්වා ඇති කරුණු පහත පරිදි වේ.

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2019 මඟින් සංශෝධිත ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ VII පරිච්ඡේදයේ 6.3 උපවගන්තිය අනුව නිලධරියෙකු කලින් දැරූ තනතුරට හෝ ශ්‍රේණියට ආපසු පත් කරනු ලැබුවහොත් එසේ ආපසු පත් කිරීම අලුත් පත් කිරීමක් සේ සලකා එසේ ආපසු පත් කරනු ලැබූ තනතුරට අයත් වැටුප් පරිමාණයේ නිලධරයා අවසන්වරට සේවය කළ පන්තියට/ශ්‍රේණියට අදාළ ආරම්භක වැටුප නිලධාරියාට ගෙවිය යුතු අතර එවැනි අවස්ථාවකදී එම පරිච්ඡේදයේ 9 වගන්තියේ විධිවිධාන අනුව වැටුප් වර්ධක වාසි ලබා දීමක් සිදු නොකළ යුතු බව

II. නිලධාරියා මුදාහැරීමට පෙර පූර්ව සේවයේදී ලබාගත් වෛද්‍ය පරීක්ෂණ වාර්තාව නව පත්වීමක් ලෙස බඳවා ගැනීමේදී සේවයේ අවශ්‍යතාව පරිදි අදාළ කර ගැනීමට හැකියාව පවතින බව

III. නිලධාරියා මුදාහැරීමට පෙර පූර්ව සේවයේදී කාර්යක්ෂමතා කඩයිම් විභාග සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කර ඇත්නම් නැවත එම අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා විභාගවලට පෙනී සිටින ලෙස නියම කිරීම අවශ්‍ය නොවන බව

IV. නිලධාරියා විධිමත් පරිදි සේවයෙන් මුදා හැරීමට පෙර සේවයේ ස්ථිර කර ඇත්නම්, පරිවාස කාලයක් නොසලකා සේවයේ ස්ථිර කිරීම කළ හැකි බව හා මුදා හැරීමට පෙර සේවයේ ස්ථිර කර නොමැතිනම් නව පත්වීම් දින සිට වසර තුනක පරිවාස කාලයකට යටත්ව සේවයේ ස්ථිර කළ හැකි බව

V. නිලධාරිනිය නැවත සේවයේ පිහිටුවීමේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2017 අනුව නව පත්වීමක් ලෙස බඳවා ගැනීම සිදු වන නිසා උසස්වීම් සඳහා පූර්ව සේවා කාලය අදාළ කර ගත නොහැකි බව

04. මෙවැනි නිලධාරීන් විශ්‍රාම ලබාගන්නා අවස්ථාවේදී විශ්‍රාම වැටුප් සකස් කිරීමේ කාර්යය සඳහා නිලධාරීන්ගේ පූර්ව සේවා කාලය එකතු කිරීමේ හැකියාවක් පවතින බව ද ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී උක්ත විධිවිධාන අනුව ක්‍රියා කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.



එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්